# <u>BIMA ලංකා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ පෞද්ගලිකත්ව ප්‍රතිපත්තිය</u>

BIMA ලංකා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම ("BIMA") ඔබගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරිමට කැපවී සිටී. මෙම පෞද්ගලිකතාවය පිළිබඳ ප්‍රතිපත්තියෙහි අයදුම්පත්‍රය සහ හිමිකම්පෑම් ආකෘති පත්‍ර, දුරකථන ඇමතුම්, ටෙක්ස්ට් පණිවුඩ, විද්‍යුත් තැපැල් පණිවුඩ සහ වෙනත් සන්නවේදන ක්‍රම ඇතුළුව මෙම වෙබ් අඩවිය සහ අපගේ ව්‍යාපාරය හරහා පෞද්ගලික දත්ත අප විසින් හසුරුවනු ලබන්නේ කෙලෙසින්ද යන්න විස්තර කරනු ලබයි.

ඔබ විසින්, අපගේ ඔප්පු දරන්නන් විසින් සහ අපේක්ෂිත සේවාදාකයන් විසින් අප වෙත ලබාදෙන තොරතුරුවල සම්පූර්ණත්වය ආරක්ෂා කර පවත්වාගෙන යාමට අප පොරොන්දු වන්නෙමු. ඔවුන් විසින් සපයනු ලබන තොරතුරු අනවසර හෙළිදරව් කිරීම් වලට යටත් නොවනු ඇති බවට සහතික වීමට අප අපේක්ෂා කරන්නෙමු. අපගේ ඔප්පු දරන්නන්ගේ සහ අපේක්ෂිත සේවාදායකයින්ගේ පෞද්ගලික දත්ත ලබා ගැනීම, දරා සිටීම, සැකසුම සහ/හෝ භාවිතය සම්බන්ධයෙන් අපගේ වගකීම් අප හඳුනා ගන්නෙමු.

අපගේ අයදුම්පත්‍රය සහ හිමිකම් ආකෘති පත්‍ර දුරකථන ඇමතුම්, ටෙක්ස්ට් පණිවුඩ, විද්‍යුත් තැපැල් පණිවුඩ සහ අනෙකුත් සන්නිවේදන ක්‍රම හරහා අප නිරත වී සිටින අපගේ සේවාවන් සහ නිෂ්පාදන භාවිත කිරීම මගින් ඔබ විසින් ස්වේච්ඡාවෙන් ඔබගේ දත්ත අප වෙත සපයයි. ඉල්ලා සිටි දත්ත අප වෙත නොසැපයීමට ඔබගේ තීරණය කිරීම තුළින් ඔබ වෙත උසස් තත්ත්වයේ සේවා සැපයීමට අපගේ උත්සාහය සීමා කරනු ඇති බවට වන අවබෝධතාවය සහිතව ඉල්ලා සිටි දත්ත අප වෙත නොසැපයීමට ඔබ විසින් තීරණය කළ හැක. ඔබගේ ඔප්පුව/ඔප්පු පිළිබඳව හෝ අපගේ නිෂ්පාදන සහ සේවාවන් පිළිබඳව විස්තර සම්බන්ධයෙන් විමසීම් කරන අවස්ථාවේදී අපගේ නිෂ්පාදන හෝ සේවාවන් ඔබ විසින් යොදා නොගන්නේ නම් සහ යොදා ගන්නා තෙක් හෝ කැමැත්තෙන්ම තොරතුරු නොසපයන්නේ නම් හෝ සපයන තෙක් මෙම වෙබ් අඩවිය හරහා හෝ වෙනත් කිසිඳු ආකාරයක් හරහා ඔබ නිසැකවම සහ සෘජුවම හඳුනාගනු ලබන ඔබගෙන් කිසිඳු තොරතුරක් "BIMA" විසින් ලබා නොගනු ඇත.

ඔබගේ පෞද්ගලික තොරතුරු අප වෙත සැපයීම මගින් මෙම ප්‍රතිපත්තියට සහ අදාළ වන නීති සහ රෙගුලාසිවලට අනකූලව තොරතුරු ලබා ගන්නා කාර්යය ඉටු කිරීමට අවශ්‍ය වන තාක්කල් ඔබගේ තොරතුරු “BIMA” විසින් රඳවා තබා ගෙන බෙදා ගනු ඇති/හවුලේ පරිහරණය කරනු ඇති බවට ඔබ විසින් පිළිගෙන එකඟ වන්නේය. ලබා ගන්නා ලද දත්තමාරු කරන අවස්ථාවේදී “BIMA” හි පරිගණකය තුළ දත්තවලට භෞතික ප්‍රවේශය සීමා කිරීම සහ සංවේදී දත්ත සංකේතවලට හැරවීම ඇතුළුව අනවසර සහ හදිසි ප්‍රවේශ, සැකසුම්, මකා දැමීම්, නැතිවීම හෝ භාවිත කිරීම වළක්වාලීමට සාධාරණ සහ සුදුසු ආරක්ෂිත ක්‍රියාමාර්ග “BIMA” විසින් අදාල කර ගනු ලබයි. තොරතුරු ලබා ගන්නා ලද අරමුණ සඳහා තවදුරටත් එම තොරතුරු අවශ්‍ය නොවන අවස්ථාවේදී එම තොරතුරු මකා දැමීමට හෝ විනාශ කිරීමට සාධාරණ පියවර ගනු ඇත.

මෙම පෞද්ගලිකභාවය පිළිබඳ ප්‍රතිපත්තිය “BIMA” නියෝජිතයින් විසින් සිදු කරනු ලබන පරිදි දත්ත ලබා ගැනීමේ සහ වාර්තා ගත කිරීම සම්බන්ධිත විකුණුම් සහ අලෙවිකරණ ක්‍රියාවන්වලටද අදාළ වන්නේය.

මෙම ප්‍රතිපත්තිය තුළින් (1) පෞද්ගලික දත්ත ලබා ගැනීම; (2) පෞද්ගලික දත්ත භාවිතය; (3) පෞද්ගලික දත්ත බෙදා ගැනීම; (5) අපගේ සන්තකයේ ඇති ඔබගේ පෞද්ගලික දත්ත සම්බන්ධයෙන් ආරක්ෂිත ක්‍රියාමාර්ග; (6) ඔබ විසින් සපයනු ලබන අනෙකුත් තැනැත්තන් වෙත අදාළ පෞද්ගලික දත්ත සම්බන්ධයෙන් අපගේ සැළකීම; (7) ඔබ සමඟ අපගේ අලෙවිකරණ සන්නිවේදනයන් සහ; (8) ප්‍රවේශය, නිවැරදි කිරීම, අරමුණ සහ ඉල්ලීම් ඉවත් කිරීම මෙන්ම අපගේ සන්තකයේ ඇති ඔබගේ පෞද්ගලික දත්ත සම්බන්ධයෙන් ඔබ විසින් මතු කළහැකි ප්‍රශ්න හෝ සැළකිලිමත් විය යුතු කරුණු විමසනු ලබන ආකාරය සම්බන්ධයෙන් වන තොරතුරු ඔබ වෙත සපයන්නේය.

**පෞද්ගලික දත්ත ලබා ගැනීම**

“පෞද්ගලික තොරතුරු යනු”, ද්‍රව්‍යමය ආකාරයෙන් වාර්තාගත වී ඇති හෝ නොමැති, ඒ තුළින් ඔබගේ අනන්‍යතාවය පැහැදිලි වන හෝ එම තොරතුරු රඳවා ගෙන සිටින ස්ථිතිය මගින් සාධාරණ ලෙස සහ ඍජුව තහවුරු කරගත හැකි හෝ අනෙක් තොරතුරු සමඟ ගත් කළ ඔබව ඍජුව සහ නිශ්චිතව හඳුනාගනු ලබන ඕනෑම තොරතුරකි.“සංවේදී පෞද්ගලික තොරතුරු” යනුවෙන් සඳහන් වන්නේ” (i) ඔබගේ ජාතිය පිළිබඳව, ජන වර්ගයේ ආරම්භ පිළිබඳව, විවාහක තත්ත්වය, වයස පිළිබඳව, වර්ණය සහ ආගමික, දාර්ශනික හෝ දේශපාලන අනුබැඳීම් පිළිබඳව; (ii) ඔබගේ සෞඛ්‍ය, අධ්‍යාපනය, ජානමය හෝ ලිංගික ජීවිතය හෝ ඔබ විසින් සිදුකර ඇති හෝ සිදුකර ඇතැයි කියාපාන ඕනෑම වරදක් සඳහා වූ ඕනෑම නීති කෘතියක් පිළිබඳව, එම නීති කෘතීන්

අවසන් කිරීම හෝ එවැනි නීති කෘතින් වලදී ඕනෑම අධිකරණයක දඬුවම පිළිබඳව සහ (iii) සමාජ ආරක්ෂක අංක, පෙර සහ වර්තමාන සෞඛ්‍ය වාර්තා, බලපත්‍ර හෝ ඒවායේ අපලාපනයන්, අත්හිටුවීම් හෝ ඉවත් කර ගැනීම් සහ බඳු වාර්තා ඇතුළුව නමුත් ඒවාට සීමා නොවී ඔබ වෙත යම් රජයේ ආයතනයක් විසින් නිකුත් කළ පෞද්ගලික තොරතුරු පිළිබඳවය. මෙහි සඳහන් පරිදි "පෞද්ගලික දත්ත" මගින් සඳහන් කරනු ලබන්නේ සියලු වර්ගවල පෞද්ගලික තොරතුරු පිළිබඳවය.

පාරිභෝගිකයෙක්, රක්ෂිත පුද්ගලයෙක්, හිමිකම්පාන තැනැත්තෙක්, වාණිජමය තැරැව්කරුවෙක් හෝ අප සමඟ ගනුදෙනු කරන වෙනත් අයෙකු වශයෙන් ඔබ පිළිබඳව සහ ඔබගේ යැපෙන්නන් පිළිබඳව ලබාගත් පෞද්ගලික තොරතුරු අතරට පහත තොරතුරු ඇතුලත් විය හැක. එනම්,

01. **සාමාන්‍ය තොරතුරු සහ සම්බන්ධ කරගත හැකි තොරතුරු**

ඔබගේ නම, ලිපිනය, විද්‍යුත් තැපැල් ලිපිනය සහ දුරකථන විස්තර; ස්ත්‍රී පුරුෂභාවය; විවාහක අවිවාහක තත්ත්වය; පවුලේ තත්ත්වය; උපන්දිනය; මුරපද; අධ්‍යාපන පසුබිම; භෞතික උපලක්ෂණ; රිය පැදවීම සහ වෙනත් ක්‍රියාකාරකම් වාර්තා; ඡායාරූප; රැකියා ඉතිහාසය; දක්ෂතා සහ පළපුරුද්ද; වෘත්තීය බලපත්‍ර සහ අනුබැඳීම් ඔප්පු දරන්නාට, රක්ෂිතයාට හෝ හිමිකම්පාන්නාට ඇති සම්බන්ධතාව සහ මරණය, තුවාලය හෝ ආබාධිත තත්ත්වය පිළිබඳ දිනය සහ හේතුව.

02. **රාජ්‍ය ආයතන හෝ නියෝජිත ආයතන විසින් නිකුත් කළ හඳුනා ගැනීමේ අංක**

සමාජ ආරක්ෂණ අංකය; මුරපද අංකය; බදු හඳුනා ගැනීමේ අංකය; හමුදා හඳුනා ගැනීම් අංකය; හෝ රියදුරු හෝ වෙනත් බලපත්‍ර අංකය

03. **මූල්‍ය තොරතුරු සහ ගිණුම් විස්තර**

ගෙවීම් කාඩ්පත් අංකය; බැංකු ගිණුම් අංකය සහ ගිණුම් විස්තර; ණය ඉතිහාසය සහ ණය අයගණන ආදායම; විද්‍යුත් පසුබිම් ගිණුම් අංකය සහ වෙනත් මූල්‍ය තොරතුරු

## 04. වෛද්‍ය තත්ත්වය සහ සෞඛ්‍ය තත්ත්වය

වර්තමාන හෝ කලින් ශාරීරික හෝ මානසික හෝ වෛද්‍ය තත්ත්වය; සෞඛ්‍ය තත්ත්වය; තුවාල හෝ ආබාධිත තත්ත්ව තොරතුරු; සිදුකරන ලද වෛද්‍ය ක්‍රියාපටිපාටිය; පෞද්ගලික පුරුදු (උදාහරණයක් වශයෙන් දුම්බීම හෝ මත්පැන් පානය කිරීම); බෙහෙත් වට්ටෝරු තොරතුරු වෛද්‍ය ඉතිහාසය

## 05. වෙනත් සංවේදී තොරතුරු

යම් අවස්ථාවන්හිදී ඔබගේ වෘත්තීය සමාජිකත්වය, ආගමික විශ්වාසය, දේශපාලනික මතවාදයන්, පවුලේ සෞඛ්‍ය ඉතිහාසය හෝ ජානමය තොරතුරු පිළිබඳ සංවේදී තොරතුරු අප වෙත ලැබිය හැක. අතිරේකව වංචා වළක්වා ගැනීම, සොයා ගැනීම සහ විමර්ශනය කිරීම ක්‍රියාවලියේදී ඔබගේ අපරාධමය නඩු වාර්තා හෝ සිවිල් නඩු වාර්තාවල ඉතිහාසය පිළිබඳව අප විසින් තොරතුරු ලබාගත හැකිය. ඔබ විසින් සංවේදී තොරතුරු අප වෙත ස්වේච්ඡාවෙන් සපයනු ලබන්නේ නම් (ඔබගේ ආගමික විශ්වාසය මත පදනම්ව වෛද්‍ය ප්‍රතිකාරවලදී ඔබ වඩාත් කැමති කරුණු වැනි) සංවේදී තොරතුරු ද අප විසින් ලබාගත හැක.

## 06. දුරකථන පටිගත කිරීම් සහ අනෙකුත් සන්නිවේදනයන්

අපගේ නියෝජිතයන් වෙත හෝ ඇමතුම් මධ්‍යස්ථාන වෙත දුරකථන ඇමතුම් පටිගත කිරීම් හෝ අපගේ සමාගමේ ඕනෑම නියෝජිතයෙක් සමඟ හෝ අප වෙනුවෙන් ගනුදෙනු කරන ඕනෑම තුන්වන පාර්ශවයක් සමඟ ඩිජිටල් ආකාරයෙන් හෝ අන්‍යාකාරයෙන් ඕනෑම වෙනත් ආකාරයක පණිවුඩ හුවමාරුවක්.

## 07. නිෂ්පාදනය සහ සේවාවන් සැපයීමට අපට හැකි වන තොරතුරු

දේපල; ඔබ විසින් රක්ෂණය කිරීමට කැමති පුද්ගල කණ්ඩායම්වල වයස; ඔප්පු සහ හිමිකම්පෑම් අංක; ආවරණය/ආවරණ/උපද්‍රව විස්තර; පාඩු පිළිබඳ හේතුව; පූර්ව අනතුරු හෝ අලාභ ඉතිහාසය; සංවිධානයක අධ්‍යක්ෂවරයෙක් හෝ හවුල්කරුවෙක් හෝ වෙනත් හිමිකාරත්වයක් හෝ කළමනාකරණ බැඳියාවක් වශයෙන් වන ඔබගේ තත්ත්වය සහ ඔබ දරා සිටින වෙනත් රක්ෂණයක්.

## 08. අලෙවිකරණ අභිරුචීන් සහ ගනුදෙනුකාර ප්‍රතිචාර

ඔබ විසින් ඔබගේ අලෙවිකරණ අභිරුචීන්, තරඟයකට හෝ දිනුම් ඇදීමකට හෝ වෙනත් අලෙවිකරණ ප්‍රවර්ධනයකට ඇතුළුවීම හෝ ස්වේච්ඡා ගනුදෙනුකාර තෘප්තිමත් කිරීමේ සමීක්ෂණයකට ප්‍රතිචාර ඔබ විසින් අප වෙත දැනුම්දීමට සළස්වනු ඇත.

**පෞද්ගලික දත්ත භාවිතය**

ඔබගේ රක්ෂණ අවශ්‍යතා අවබෝධ කරගෙන උසස් තත්ත්වයේ ගනුදෙනුකාර සේවා සහ නිෂ්පාදනයන් සැපයීම සඳහා අප හට අදාල සහ වැදගත් වන බවට අප විශ්වාස කරනු ලබන පෞද්ගලික දත්ත පමණක් "BIMA" විසින් ලබාගනු ඇත. මේ සම්බන්ධයෙන් පෞද්ගලික දත්තයන් ලබාගෙන "BIMA" විසින් සහ එහි අනුබද්ධ ආයතනයන් විසින් භාවිත කරනු ලබන විශේෂිත කාර්යයන් පහත පරිදි වන්නේය.

- ඔබ ලියාපදිංචි වී ඇති නිෂ්පාදන සහ සේවා සැපයීම (රක්ෂණය සහ සෞඛ්‍ය ඇතුළුව නමුත් ඊට සීමා නොවී)
- අපගේ ව්‍යාපාර මෙහෙයුම් කටයුතු පැවැත්වීමේදී ඔබ සහ අනෙකුත් තැනැත්තන් සමඟ සන්නිවේදනය කිරීම
- අපගේ ප්‍රතිපත්තිවල, වෙනත් නියමයන් සහ කොන්දේසිවල අනෙකුත් පරිපාලනමය තොරතුරුවල වෙනස්වීම් සම්බන්ධයෙන් වැදගත් තොරතුරු ඔබ වෙත යැවීම
- හිමිකම් තක්සේරුව, ක්‍රියාවලිය සහ ගෙවා පියවීම ඇතුළුව රක්ෂණ සහ ආශ්‍රිත සේවාවන් සපයනවාද නැද්ද යන්න පිළිබඳව තීරණ ගැනීම
- ගෙවීම් සැළසුම් සම්බන්ධයෙන් ඔබගේ සුදුසුකම් තක්සේරු කිරීම සහ ඔබගේ වාරිකය සහ අනෙකුත් ගෙවීම් සැකසීම
- වංචාව සහ මුදල් විශුද්ධිකරණය ඇතුළු අපරාධ වළක්වාලීම සොයා ගැනීම සහ විමර්ශනය කිරීම සහ වාණිජ අවදානම් විශ්ලේෂණය කර කළමනාකරණය කිරීම
- වෙළෙඳපොළ පර්යේෂණ සහ විශ්ලේෂණයන් සිදු කිරීම
- නිෂ්පාදනයන් සහ සේවා අලෙවි කිරීම සඳහා ඔබගේ සුදුසුකම දැක්වෙන අප සන්තකයේ ඇති තොරතුරුවලට අනුකූලව ඔබ වෙත අලෙවිකරණ තොරතුරු සැපයීම (තෝරාගත්

තුන්වන පාර්ශව හවුල්කරුවන් විසින් ඉදිරිපත් කරන වෙනත් නිෂ්පාදන සහ සේවා පිළිබඳ තොරතුරු ඇතුළත්ව)

- ඔබ සහභාගී වන තරඟ, දිනුම් ඇදීම් සහ සමාන ප්‍රවර්ධනයන් පාලනය කිරීම
- අපගේ යටිතල පහසුකම් සහ ව්‍යාපාර මෙහෙයුම් කටයුතු පාලනය සහ විගණනය; මූල්‍ය සහ ගිණුම්කරණය; බිල්කරණය සහ එකතු කිරීම්; තොරතුරු තාක්ෂණ පද්ධති; දත්ත සහ වෙබ් අඩවි සත්කාරකරණය; ව්‍යාපාර අවිච්ඡින්නතාව; සහ වාර්තා ලේඛන සහ මුද්‍රණ කළමනාකරණයට අදාළ අභ්‍යන්තර ප්‍රතිපත්ති සමඟ ක්‍රියාපටිපාටීන් ඇතුළුව ඒවාට අනුකූලව කටුතු කිරීම
- පැමිණිලි විසඳීම සහ  දත්ත ප්‍රවේශය සහ නිවැරදි කිරීම සඳහා ඉල්ලීම් හැසිරවීම
- මුදල් විශුද්ධිකරණයට එරෙහි සහ ත්‍රස්තවාදයට එරෙහි කරුණු වලට අදාළ වන නීති සහ නියාමන වගකීම්වලට (ඔබ පදිංචි රටෙන් බැහැර නීති ඇතුළුව) අනුකූලව කටයුතු කිරීම; නෛතික ක්‍රියාවලීන්ට අනුකූලව කටයුතු කිරීම; සහ මහජනතාවගෙන් සහ රාජ්‍ය බලධාරී ආයතන වලින්  (ඔබ පදිංචි රටෙන් බැහැර ඒවා ඇතුළුව) ඉල්ලීම් වලට ප්‍රතිචාර දැක්වීම
- නෛතික අයිතිවාසිකම් පිහිටුවීම සහ ආරක්ෂා කිරීම; අපගේ මෙහෙයුම් කටයුතු හෝ අපගේ ඕනෑම සමාගමක හෝ රක්ෂණ ව්‍යාපාර හවුල්කරුවෙකුගේ මෙහෙයුම් කටයුතු, අපගේ අයිතිවාසිකම්, පෞද්ගලිකත්වය, ආරක්ෂාව හෝ දේපල, අපගේ සමූහ ව්‍යාපාර සමාගම්වල, ඔබගේ හෝ අන් අයගේ දේපල ආරක්ෂා කිරීම සහ තිබෙන ප්‍රතිකර්ම සොයා යාම හෝ අපගේ හානි සීමා කිරීම

**පෞද්ගලික දත්ත බෙදා ගැනීම (sharing)**

"BIMA" විසින් ඔබගේ පෞද්ගලික දත්ත පහත සඳහන් අයවලුන් වෙත ලබා ගැනීමට සලස්වනු ඇත;

- **අපගේ සමූහ ව්‍යාපාරයේ සමාගම්**

පෞද්ගලික දත්ත හවුලේ භාවිත කිරීම සම්බන්ධයෙන් වන කළමනාකරිත්වය සහ ආරක්ෂාව සම්බන්ධයෙන් "BIMA" වගකිය යුතු වන්නේය.  "BIMA" තුළ ඇති පෞද්ලික දත්තවලට ප්‍රවේශය අපගේ ව්‍යාපාර කාර්යයන් සඳහා තොරතුරුවලට ප්‍රවේශය ලබා ගැනීමට අවශ්‍යතාවක් ඇති සුදුසු පිරිස් හෝ පුද්ගලයන්ට සීමා කරනු ලැබේ.

- **අනෙකුත් රක්ෂණ සහ බෙදා හැරීම් පාර්ශවයන්**

රක්ෂණ නිෂ්පාදනයන් අලෙවි කිරීමේ සහ විකිණීම සහ හිමිකම්පෑම් සැකසීම් කාර්යයේදී "BIMA" විසින් වෙනත් රක්ෂකයන්, ප්‍රතිරක්ෂකයන්, රක්ෂණ සහ ප්‍රතිරක්ෂණ තැරැව්කරුවන් සහ වෙනත් අතරමැදියන් සහ නියෝජිතයන්, පත්කළ නියෝජිතයන්, බෙදා හරින්නන්, සබඳතා අලෙවිකරණ හවුල්කරුවන් සහ මූල්‍ය ආයතන ආරක්ෂක ආයතන සහ වෙනත් ව්‍යාපාර හවුල්කරුවන් වැනි තුන්වන පාර්ශවයන් වෙත පෞද්ගලික දත්ත ලබා ගැනීමට සැළැස්විය හැක.

**අපගේ සේවා සැපයුම්කරුවන්**

- දුරකථන සන්නිවේදන සමාගම්, මූල්‍ය සේවා සැපයුම්කරුවන්, විද්‍යුත් වාණිජ ස්ථතීන්, වෛද්‍ය වෘත්තිකයින්, ගණකාධිකාරීවරුන්, ආයුගණකයින්, විගණකවරුන්, විශේෂඥවරුන්, නීතිඥවරුන් සහ වෙනත් බාහිර වෘත්තීය උපදේශකවරුන් වැනි බාහිර තුන්වන පාර්ශව සේවා සපයන්නන්; සංචාරක සහ වෛද්‍ය සහාය සැපයුම්කරුවන්; ඇමතුම් මධ්‍යස්ථාන සේවා සැපයුම්කරුවන්; තොරතුරු තාක්ෂණ පද්ධති, සහාය සහ ආගන්තුක සත්කාර සේවා සැපයුම්කරුවන්, මුද්‍රණ, වෙළඳ ප්‍රචාරණය, අලෙවිකරණ සහ වෙළෙඳපොළ පර්යේෂණ සහ විශ්ලේෂණ සේවා සැපයුම්කරුවන්, බැංකු සහ අපගේ ගිණුම් සේවාකරණ මූල්‍ය ආයතන; තුන්වන පාර්ශවය හිමිකම්පාන පරිපාලකයින්; ලේඛන සහ වාර්තා කළමනාකරණ සැපයුම්කරුවන්; හිමිකම් විමර්ශකයන් සහ ගැලපුම්කරුවන්; ඉදිකිරීම් උපදේශකයන්; ඉංජිනේරුවන්; පරීක්ෂකරුවන්; ජූරි උපදේශකයන්; පරිවර්තකයන් සහ ඒ හා සමාන තුන්වන පාර්ශව විකුණුම්කරුවන් සහ ව්‍යාපාර කටයුතු සිදු කරගෙන යාමේදී අපට සහාය වන බහිස්සේවාර්පන සේවා සැපයුම්කරුවන්

අපගේ ව්‍යාපාරයේ විශ්වීය ස්වභාවය හේතුවෙන් ඉහත සඳහන් කරන ලද අරමුණු වෙනුවෙන් අප විසින් ශ්‍රී ලංකාවෙන් බැහැර පිහිටි දත්ත සර්වරයන් වෙත පෞද්ගලික දත්ත මාරු කළ හැකිය. අප විසින් තොරතුරු හිතාමතාම අපගේ සමූහ ව්‍යාපාර සමාගම් වෙත, සේවා සැපයුම්කරුවන් වෙත, ව්‍යාපාර හවුල්කරුවන් වෙත සහ රාජ්‍ය හෝ පොදු බලධාරීන් වෙත මාරු කළ හැකිය. මෙම ස්ථතීන් සඳහන් කරන ලද එම පෞද්ගලිකත්ව ප්‍රතිපත්ති මගින් බැඳී සිටිය යුත්තේය.

- **රාජ්‍ය අධිකාරීන් සහ අධිකරණ නඩුවලදී සම්බන්ධිත තුන්වන පාර්ශවයන්**

“BIMA” විසින් පෞද්ගලික දත්ත රාජ්‍ය හෝ වෙනත් මහජන අධිකාරීන් (අධිකරණ, නීතිය බලාත්මක කිරීම, බදු අධිකාරීන් සහ අපරාධ පරීක්ෂණ නියෝජිත ආයතන ඇතුළුව නමුත් ඒවාට සීමා නොවී) සහ තුන්වන පාර්ශව සිවිල් නෛතික ක්‍රියාවලට සහභාගී වන තැනැත්තන් සහ ඔවුන්ගේ ගණකාධිකාරීවරුන්, විගණකවරුන්, නීතිඥවරුන් සහ වෙනත් උපදේශකවරුන් සහ (අ) ඔබ පදිංචි රටින් බැහැර නිති ඇතුළුව අදාළ නීතිවලට අනුකූලව කටයුතු කිරිමට; (ආ) නෛතික ක්‍රියාවලීන්ට අනුකූලව කටයුතු කිරීම; (ඇ) ඔබගේ පදිංචි රටෙන් බැහැර පොදු සහ රාජ්‍ය අධිකාරීන්ගේ ඉල්ලීම් වලට ප්‍රතිචාර දැක්වීමට; (ඈ) අපගේ නියමයන් සහ කොන්දේසි බලාත්මක කිරීමට; (ඉ) අපගේ මෙහෙයුම් කටයුතු හෝ අපගේ සමූහ ව්‍යාපාර සමාගම් කිසිවක හෝ මෙහෙයුම් කටයුතු ආරක්ෂා කිරීමට; (ඊ) අපගේ අයිතිවාසිකම්, පෞද්ගලිකත්වය, ආරක්ෂාව හෝ දේපල සහ/හෝ අපගේ සමූහ ව්‍යාපාරයේ සමාගම්වල, ඔබගේ හෝ අන් අයගේ අයිතිවාසිකම්, පෞද්ගලිකත්වය ආරක්ෂාව හෝ දේපල ආරක්ෂා කිරීමට සහ; (උ) තිබෙන ප්‍රතිකර්ම ඉල්ලා කටයුතු කිරීමට හෝ අපගේ අලාභ සීමා කිරීමට අප හට ඉඩ ලබාදීමට අවශ්‍ය හෝ සුදුසු බවට අප විශ්වාස කරන නියෝජිතයන් වෙත පෞද්ගලිකත්ව බෙදා ගැනීම් ද සිදුකළ හැකිය.

- **වෙනත් තුන්වන පාර්ශවයන්**

අප විසින් පෞද්ගලික දත්ත ආදායකයින් සමඟ, හදිසි සේවා සැපයුම්කරුවන් සමඟ (ගිනි, පොලිස් සහ වෛද්‍ය හදිසි සේවාවන්) සිල්ලර වෙළෙඳුන් සමඟ, වෛද්‍ය ජාල සමඟ, සංවිධාන සහ සැපයුම්කරුවන් සමඟ, සංචාර වාහකයන් සමඟ, ණය කාර්යාංශයන් සමඟ, ණය වාර්තාකරණ නියෝජිත ආයතන සමඟ සහ හිමිකම්පෑමක විෂයගත කාරණාව වන්නා වූ අනතුරකට සම්බන්ධිත වෙනත් තැනැත්තන්; මෙන්ම ඕනෑම නියම හෝ යෝජිත නැවත සංවිධාන ගත කිරීමකදී ඒකාබද්ධ කිරීම, විකිණීම, හවුල් ව්‍යාපාර, පැවරීම, විකිණීම හෝ වෙනත් අපගේ ව්‍යාපාර, වත්කම් හෝ තොග සියල්ල හෝ ඕනෑම කොටසකට අදාළව වෙනත් ගනුදෙනුවකදී මිලදී ගැණුම්කරුවන් සහ අපේක්ෂිත ගැණුම්කරුවන් හෝ වෙනත් පාර්ශවයන් සමඟ පෞද්ගලික දත්ත බෙදාගනු ඇත.

**ආරක්ෂිත ක්‍රියාමාර්ග**

"BIMA" විසින් අදාල පෞද්ගලිකභාවය සහ දත්තවල ආරක්ෂිත නීතිවලට ගැලපෙන්නා වූ සුදුසු තාක්ෂණික, භෞතික සහ සංවිධානාත්මක ක්‍රියාමාර්ග ගනු ඇත. අන්තර්ජාලය හෝ දත්ත ගබඩා කරන පද්ධතීන් හරහා දත්ත සම්ප්‍රේෂණය කිරීම කිසිදු අවස්ථාවක සම්පූර්ණයෙන්ම ආරක්ෂිත නොවන බවට කරුණාකර දැනුවත් වන්න. අප සමඟ වන ඔබගේ සමාජානුයෝජනය අමාරුවෙහි හෙළා ඇති බවට විශ්වාස කිරීමට ඔබට හේතු ඇත්නම් කරුණාකර වහාම අප වෙත දැනුම් දෙන්න. ඔබ විසින් info@bima.lk මගින් අප වෙත විද්‍යුත් තැපැල් යොමු කළ හැකිය.

සේවා සැපයුම්කරුවන්ව සැළකිල්ලෙන් යුතුව තෝරාගනු ලබනු ඇති අතර ඔබගේ පෞද්ගලික දත්තවල රහස්‍යභාවය, ආරක්ෂාව සහ අවංකත්වය ආරක්ෂා කිරීමට සුදුසු ක්‍රියාමාර්ග භාවිත කිරීමට නියමිත වනු ඇත.

**වෙනත් පුද්ගලයන්ගේ පෞද්ගලික තොරතුරු**

ඔබ විසින් ඔබගේ යැපෙන්නන් හෝ අර්ථලාභීන් වැනි වෙනත් පුද්ගලන් සම්බන්ධයෙන් "BIMA" වෙත පෞද්ගලික තොරුතුරු සපයනු ලබන්නේ නම්:

(අ) මෙම පෞද්ගලික ප්‍රතිපත්තියෙහි අඩංගු කරුණු පිළිබඳව පුද්ගලයන් වෙත දැනුම් දීමට සහ

(ආ) මෙම පෞද්ගලික ප්‍රතිපත්තියට අනුකූලව පුද්ගලයන් පිළිබඳව පෞද්ගලික තොරතුරු ලබාගැනීම, භාවිත කිරීම, හෙළිදරව් කිරීම සහ පැවරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට ඔබ එකඟ වන්නේය.

**අලෙවිකරණ අභිරුචීන්**

ඔබගේ අලෙවිකරණ අභිරුචීන් පිළිබඳව අපව දැනුවත් කිරීමට ඔබ වෙත නිත්‍ය අවස්ථාවන් අප විසින් සපයනු ඇත. ඔබගේ අලෙවිකරණ අභිරුචීන් පිළිබඳව අප වෙත දැනුම්දීමට හෝ අපගේ අලෙවිකරණ සන්නිවේදනයන් ලැබීම් තෝරා ගැනීමට info@bima.lk මගින් අප වෙත ඔබට එළඹිය හැක.

හැකි කඩිනම් ආකාරයකින් තෝරා ගැනීමට ඔබගේ ඉල්ලීම්වලට අනුකූලව කටයුතු කිරීමට අප අරමුණු කරන්නෙමු. ඔබ විසින් අපගෙන් අලෙවිකරණ සන්නවේදනයන් ලැබීමට තීරණය කරනු ලබන්නේ නම් ඔබ සමඟ හෝ "BIMA" සමඟ ඔබගේ ප්‍රතිපත්ති සමඟ අප ගනුදෙනුවලට අදාළව වෙනත් වැදගත් පරිපාලනමය සන්නවේදනයන් අප විසින් ඔබ වෙත එවනු ඇති බවට කැරුණාකර කෙසේ වෙතත් අවබෝධ කර ගන්න.

**බලාත්මක දිනය**

මෙම පෞද්ගලිකත්ව ප්‍රකාශය 2020.04.01 දිනට බලාත්මක වන්නේය. මෙම පෞද්ගලිකත්ව ප්‍රතිපත්තිය වෙනස් කිරීමේ අයිතිය අප රඳවා තබා ගන්නෙමු. අප විසින් මෙම ප්‍රතිපත්තිය වෙනස් කරනු ලබන්නේ නම් මෙම පිටුවෙහි වර්තමාන පෞද්ගලිකත්ව ප්‍රකාශය අප විසින් යොමු කරනු ඇත. මෙම ප්‍රකාශයට කරනු ලබන ඕනෑම වෙනස් කිරීම් ඒවා යොමු කරනු ලබන දිනයේ සිට බලාත්මක වනු ඇත.